# 11 වසර සිංහල සාහිත්‍ය කෙටි සටහන්

## 'අපට වැසිකිළියක්' කළු ආරච්චිගේ ජයතිලක මහතා
## (ක්‍රි.ව. 1926 - 2010)



- කළු ආරච්චිගේ ජයතිලක ගුරින් (ක්‍රි.ව. 1926 - 2010) හැඳින්වීම

සිංහල සාහිත්‍ය වංශයෙහි සුවිශේෂ කෙටිකතාකරුවෙකු ලෙස විචාරක අවධානය දිනා ගත් කළුආරච්චිගේ ජයතිලක මහතා බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ කිරිඳිවැල රදාවාන ප්‍රදේශයේ දී 1926-06-27 වන දින උපත ලබා ඇත.ඔහු නව දෙනෙකුගෙන් යුක්ත පවුලේ තෙවනියා වේ. රදාවාන පිරිමි පාසැලෙන් මූලික අධ්‍යාපනය ලද එතුමා ස්වෝත්සාහයෙන් පාලි භාෂාව පිළිබඳව ද මනා පරිචයක් ඇතිකර ගත්තේ ය.

පසු ව හෙතෙම ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ද හිමි කරගෙන තිබේ. කේ.ජයතිලකගේ මුල් ම කෙටිකතා සංග්‍රහය වන්නේ පුනරුප්පත්තිය සහ තවත් කෙටිකතා කෘතිය යි. එතුමා කෙටිකතාකරුවෙකු, නවකතා කරුවෙකු හා පළපුරුදු සාහිත්‍ය විචාරකයෙකු ලෙස පාඨකයාගේ නොමඳ ජනප්‍රසාදය ලබා ගෙන ඇත. ඔහුගේ සාහිත්‍ය මෙහෙවර උදෙසා සාහිත්‍ය රත්න සම්මානයෙන් ද ශ්‍රී ජයවර්ධනපුර සරසවියෙන් සාහිත්‍ය සූරි ආචාර උපාධියක් ද පිරිනමා ඇත. සිංහල ලේඛක සංවිධානයේ ප්‍රථම භාණ්ඩාගාරික ධුරය ද,සිංහල කලා මණ්ඩලයේ සභාපති ධුරය ද දරමින් අසහාය මෙහෙවරක් කළ කන්නිමහර ප්‍රාඥයා යන විරුදාවලි ලත් කේ.ජයතිලක මහතා 2010 වසරේ දී සදහට ම නිහඬ විය.

**කෙටිකතා නිර්මාණ**

කටු සහ මල්
වජිර පබ්බත
පුනරුප්පත්තිය
එක ගෙයි අවුරුද්ද
දියඹිය ආපසු එයි
අතීරණය
නොනිමි සිත්තම
අනාත්මික කෙටිකතා හතක්

**සාහිත්‍ය විචාර ග්‍රන්ථ**

සාහිත්‍ය විචාර සටහන්
සාහිත්‍ය විචාර මුල් පොත
නව කතා හා සමාජ
සිංහල කතා කලාවේ විකාශනය
සමාජ ප්‍රගතිය හ සාහිත්‍යය
ජාතික සාහිත්‍යය හා වෙස්සන්තර
දෛවයෝග විචාර (ප්‍රථම)
සාහිත්‍ය විචාර චින්තාවලිය

**ළමා සාහිත්‍ය නිර්මාණ**

| | |
|---|---|
| කතන්දර පොත | 1963 |
| වන සටන | 1970 |
| අයියයි නංගියි | 1960 |
| ඕරලෝසුව සහ ලස්සන ළමයා | 1969 |
| පුංචි වළාකුළු සහ පුංචි පුතා | 1971 |
| ධුං ධුං ඩුඩුං ධුං | 1972 |
| මිහිබට පරපුර | 1974 |
| රුවන් කුමාරි | 1978 |
| ඩිංගිරි | 1972 |
| ඉස්සරහා බලන්නෝ | 1972 |

**නාට්‍ය නිර්මාණ**

නගරාධිපති

**කාව්‍ය නිර්මාණ**

ව්‍යංගා ( මහගමසේකර සමග)

**චරිතාපදාන**

පුංචි පැලේ ගස වෙනා
(ස්වයං චරිතාපදානය)

**නම් කතා නිර්මාණ**

| | |
|---|---|
| පරාජිතයෝ (ප්‍රථම) | අප්‍රසන්න කතාවක් (දෙවැනි) |
| පරාජිතයෝ | දෙලොවට නැති අය |
| පුංචිර් රාළ | මනඃකල්පිත වාර්තාවක් |
| මායා මාලිගය | පියා සහ පුතු |
| මතුසම්බන්ධයි | රාජපක්ෂ වළව්ව |
| පිතාමහ | කාලෝ අයංතේ |
| අධිෂ්ඨාන | පුංචි රාළගේ මරණය |
| මහල්ලෙකුගේ ප්‍රේම කතාව | චරිත තුනක් |

- **කෙටිකතාවක් යනු කුමක් ද?**

කෙටිකතාව යනු, එක් ප්‍රබල මූලික අදහසක් වටා ගෙතුණු හේතුඵල සම්බන්ධය උඩ සිදුවීම් ගලා යන සංක්ෂිප්ත කලා මාධ්‍යයකි. කෙටි කතාවක හේතුඵල සම්බන්ධය යනු, කතාවෙහි ගලා යන සිදුවීම් එකිනෙක අතර ඇති වන, මනා ගැළපීමයි.

**"කෙටිකතාව ද්‍රව්‍යමය හෝ ආධ්‍යාත්මික හෝ එක් සිද්ධියක් වටා ගෙතුණු එක හුස්මට කියවා අවසන් කළ හැකි පුවතක්වයකි."** - සමර්සෙට් මෝම්

**"කෙටිකතාව එක හුස්මට පැවසීමට හෝ කියවීමට හැකි සංක්ෂිප්ත වෘත්තාන්තයකි."** - එඩ්ගා ඇලන් පෝ

**"කෙටිකතාව යනු ජීවිතයෙන් ගත් කොටසක් නිරූපණය කර කළා මාධ්‍යයකි."** - ඇන්ටන් චෙකෝෆ්

මෙ නයින් බැලූ කල කෙටිකතාකරුවා යනු කිසිඳු ආත්මයකට හසු නො වන මානුෂීය තලයෙහි ජීවිතය විවරණය කරන සංවේදී මිනිසෙකි. එබැවින් ස්වකීය නිර්මාණය තුළින් පුද්ගල ජීවිතයේ ගැඹුරු තැන් විනිවිද යාමේ හැකියාවක් ඔහු සතු වේ.

ජෝසප් බර්ග් එසන්වීන් කෙටිකතාවක් ලෙස සැලකීමට හේතුවන සාධක 7ක් පිළිබඳ අවධාරණය කර ඇත.

- සියල්ල අභිබවා සිටින එක් ප්‍රබල සිද්ධියක්
- ඉස්මතු වී පෙනෙන එක් ප්‍රධාන චරිතයක්
- පරිකල්පනය
- කතා වින්‍යාසය
- සියල්ල එකට කැටි වී තිබීම
- සංවිධානාත්මක බව
- ධාරණාවේ ඒකීයත්වය

- **කෙටිකතාවක මූලික ලක්ෂණ**

**කතා ප්‍රවෘත්තිය** - කාලයට අනුරූප ලෙස අනු පිළිවෙලින් ඉදිරිපත කරනු ලබන සිදුවීම් සමුදාය කතා ප්‍රවෘත්තියකි. එය මුල,මැද හා අග මනා සම්බන්ධතාවයකින් යුක්ත අපූර්ව හා විශ්වාසනීයත්වයකින් යුක්ත විය යුතු ය.

**කතා වින්‍යාසය** - කතා වින්‍යාසය යනු මනා හෙතුඵල සම්බන්ධතාවයකින් යුක්ත ව කතාව ඉදිරිපත් කිරීම යි.

**චරිත නිරූපණය** - කෙටිකතාකරුවාට කළ හැක්කේ චරිතයකින් එක් ප්‍රබල චරිතාංගයක් නිරූපනය කිරීමයි.

පැතලි චරිත - නිශ්චිත ස්වභාවයකින් යුත් චරිත
වටකුරු චරිත - ජීවන ධර්මතා නිරූපණය කරන චරිත

**යථාර්ථ නිරූපණය** - යථාර්ථය යනු,සමාජ ක්‍රියාවලිය හා බැඳී පැවතුණු සත්‍ය තත්ත්වය යි.

**සංකේත නිරූපණය** - කෙටිකතා කලාවේ දී ලේඛකයා එක් සිදුවීමක්, හෝ සියුම් භාව අවස්ථාවක් ඉදිරිපත් කිරීමට ඒ හා බැඳුණු සංකල්ප සංකේතාත්මක ව නිරූපණය කරති.

**දෘෂ්ටි කෝණය** - මෙයින් අදහස් කෙරෙන්නේ කතාව ඉදිරිපත් කෙරෙන්නේ කවරෙක් මගින් ද යන්න යි. එහිදී බොහෝ විට ලෙඛකයෝ,

උත්තම පුරුෂ දෘෂ්ටි කෝණය - මම නමැති පුද්ගලයා ලවා කතාව ඉදිරිපත් කිරීම
ප්‍රථම පුරුෂ දෘෂ්ටි කෝණය - කතාවේ ඇතුළත් චරිතයක් මගින් කතාව ඉදිරිපත් කිරීම සිදු කරති.

**ජීවන දෘෂ්ටිය** - කෙටිකතකරුවා සමාජය කෙරෙහි හෙළන ආකල්පය.එය අපක්ෂපාතී මධ්‍යස්ථ භාවයක් ප්‍රකට කළ යුතු වේ.

**භාෂාව** - වර්ණනාත්මක බස, ගැමි වහර, නාගරික වහර, උපමා රූපක භාවිතය ආදී භාෂා උපක්‍රමයන්ගෙන් සැළුම්ලත් භාෂාවක් යොදා ගැනීමයි.

**ඒකාබද්ධතාව** - කතා ප්‍රවෘත්තිය,වින්‍යාසය,චරිත නිරූපණය හා අවස්ථා නිරූපණය යන අංග අතර පවත්නා මනා සම්බන්ධතාවය යි.

හාමුදුරුවෝ

# 'අංගුලිමාල දමනය' ගුරුළුගෝමී පඬිතුමා - පොළොන්නරු යුගය

- ගුරුළුගෝමී පඬිතුමා - පොළොන්නරු යුගය

ගුරුළුගෝමී පඬිතුමා 12 වන ශතවර්ෂයේ අවසාන කාලයේ හෝ 13 වන ශතවර්ෂයේ මුල් කාලයේ විසූ බව පිළි ගැනේ. පළමුවන පරාක්‍රමබාහු (ක්‍රි.ව.1115 - 1186) රජතුමාගේ රාජ්‍ය සමයේ ගුරුළුගෝමී පඬිවරයා විසූ බව සමහර වියත්හු පිළිගනිති. **ගම්පොළ යුගයේ රචිත නිකාය සංග්‍රහයෙහි ගුරුළුදැමි නාමයෙන් ගුරුළුගෝමී පඬිවරයා ගැන සඳහන් වේ.**

- පොළොන්නරුව යුගයේ සාහිත්‍ය කෘති

අමාවතුර
ධර්මප්‍රදීපිකාව
බුත්සරණ
දහම්සරණ
සඟසරණ
මුවදෙව්දාවත
සසදාවත
සන්න - (සන්න හා ගැටපද ග්‍රන්ථ)
පොළොන්නරු කතිකාවත

- අංගුලිමාල දමනය

අමාවතුර කතුවරයාගේ අංගුලිමාල දමනය අංගුලිමාලයාගේ උපතටත් පෙර අවධියෙන් ආරම්භ වෙයි. ඔහු උපදින්නේ තමාගේ අනාගතය පිළිබඳ පෙර නිමිති දක්වමිනි. එම පෙර නිමිති ඔහුට අහිංසක යන නාමය පවා ලබා දීමට හේතු වෙයි. ශිල්ප ඉගෙනීමට තක්සලා නුවර දිසාපාමොක් ඇදුරු වෙත යන අහිංසකයාගේ දස්කම් දකින අනික් ශිෂ්‍යයෝ ඔහු කෙරෙහි ඊර්ෂ්‍යා කොට විනාශ කිරීමට මං සොයති. **කපටි සිසුන්ගේ උගුලට අසුවන දිසාපාමොක් ඇදුරු ගුරු පූජාවක ව්‍යාජයෙන් අහිංසකගේ ජීවිතය** නැසීමට උපායක් සලසති.ගුරුන්ට ඇඟිලි දහසක පූජාවක් කිරීමට යන අහිංසක; අංගුලිමාල නම් බිහිසුණු මිනීමරුවා බවට පත් වෙයි. මුළු රටට ම බලවත් ව්‍යසනයක් වෙයි. රහත් වීමට තරම් වාසනා ගුණැති අංගුලිමාලයා දිවැසින් දකින බුදුන් වහන්සේ, වනයට වැඩම කොට ඔහු දමනය කොට පැවිදි කරයි.රහත් බවට පත් වුව ද ගිහි කල පවෙහි විපාක වශයෙන් කායික වධ හිංසනයට ලක්වීම පමණක් නො ව සිව්පසය ලබා ගැනීම පවා අපහසු වෙයි.දිනක් **වීලි රුදාවෙන් පීඩිත ව සිටි ගැබිනී ස්ත්‍රියකට** කළ ශාන්ති කමර්යක් හේතු කොට ගෙන අංගුලිමාල මහරහතන් වහන්සේගේ කරුණා මහිමය දඹදිව පුරා පැතිර ගියේ ය.

- **සාහිත්‍ය කෙටි ප්‍රශ්න**

1) මෙම පාඩම උපුටාගත් ග්‍රන්ථය කුමක් ද ? අමාවතුර

2) එහි කතුවරයා හා සාහිත්‍ය යුගය කුමක් ද ?
පොළොන්නරු යුගයේ දී ගුරුළුගෝමී පඬිතුමා විසිනි

3) 'අමාවතුර' නම් ග්‍රන්ථය අදාළ සාහිත්‍ය ඛණ්ඩය කුමක් ද ? බණකථා ශෛලිය

4) කතුවරයා විසින් රචිත වෙනත් කෘතීන් මොනවා ද? ධර්මප්‍රදීපිකාව

5) අමාවතුර ලිවීමේ අරමුණ කුමක් ද? බුදුරජාණන්වහන්සේගේ පුරිසදම්මසාරථී නම් බුද්ධ ගුණය වර්ණනා කිරීම සඳහා

6) එහි අන්තර්ගත පරිච්ඡේද ගණන කීයද? 18කි.

7) අමාවතුර යන නාමයෙහි අර්ථය කුමක් ද? බුදුසිරිත අමාවක් කොටගෙන` අමුර්තය ගලාගෙන යන්නා වූ

8) අමාවතුර ලිවීමේ දී කතුවරයාගේ අරමුණ කෘතිය තුළ සඳහන් වන්නේ කෙසේ ද?
නොවියත් හුදී ජනයන් සඳහා සිය බසින් මා විසින් සැබෙවින් දක්වනු ලැබේ.

9) අමාවතුරෙහි 07 වැනි පරිච්ඡේදයේ එන අංගුලිමාල දමනය කතාවට මූලාශ්‍ර වූයේ මොනවා ද ?
මජ්ඣිම නිකාය අංගුලිමාල සූත්‍රය
අංගුලිමාල සූත්‍ර පාලි අටුවාව

10) අමාවතුර කෘතියෙහි පළමු පරිච්ඡේද තුන සඳහන් කරන්න.
දුර්දාන්ත දමනය
ස්වසාන්ත දමනය
පරසාන්ත දමනය

11) අමාවතුර රචනා ශෛලියෙහි විශේෂ ලක්ෂණ මොනවා ද ?
කෙටි වචන යෙදීම
කෙටි වාක්‍ය යෙදීම
වර්ණනා මඳ බව
උපමාලංකාර මඳ බව
බුද්ධ චරිතය ඉස්මතු වීම

12) නිකාය සංග්‍රහයෙහි ගුරුළුගෝමී පඬිවරයා හඳුන්වන නාමය කුමක් ද ? ගුරුළුදැමි

13) අමාවතුර ග්‍රන්ථය හඳුන්වන අපර නාමය කුමක් ද ? පුරිසදම්මසාරථී පද වර්ණනාව

14) පොළොන්නරු යුගයේ රචිත වෙනත් ග්‍රන්ථ මොනවා ද ?
බුත්සරණ - විද්‍යාචක්‍රවර්ති
ධර්මප්‍රදීපිකාව - ගුරුළුගෝමී
සසදාවත
වෙසතුරු දා සන්නය
මුවදෙව්දාවත
දීප වංසය

හිරුළු පන්තිය

# 'උග්ගසේන සිටු පුත්හුගේ වස්තුව - 256 කථාව' සද්ධර්මරත්නාවලිය

දඹදෙණි සාහිත්‍ය යුගය (ක්‍රි.ව. 1220 - 1293) 13 වන සියවස

**රත් තුළෙහි ඇමිණූ රුවන් (මැණික්) හැඩෙති කතා නිසා මෙම කෘතියට සද්ධර්මරත්නාවලිය යන නම යෙදේ.**

යුගය - දඹදෙණි සාහිත්‍ය යුගය(ක්‍රි.ව. 1220 1293) 13 වන සියවස

කර්තෘ - ධර්මසේන හිමි

අරමුණ - "යම් කෙනෙකුන් නුවණ මඳවත් කුසලච්ඡන්දය ඇතිව ධර්මාභියෝගයට උපදෙස් ලදින් බණ දැන පින්කම්හි හැසිර නිවන් සාදා ගනිත් නම් එසේ වූ සත්පුරුෂයනට වැඩ සඳහා සද්ධර්ම රත්නාවලී නම් මෙම ප්‍රබන්ධය කරම්හ." මෙම පාඨයට අනුව සද්ධර්මරත්නාවලිය රචනා කොට ඇත්තේ සාමාන්‍ය පොදු ජනයා අරමුණු කොට ගෙන බව පැහැදිලි වේ.

ආශ්‍රිත ග්‍රන්ථ - මෙම ග්‍රන්ථය දෙවන පරාක්‍රමබාහු රජ දවස බුද්ධඝෝෂ හිමි විසින් අනුරාධපුර පොළොන්නරු යුගයේ දී ලියැවුණු පාලි ධම්මපදට්ඨ කථාව ඇසුරෙන් කරන ලද්දකි. එහෙත් එය හුදු පදානුගත පරිවර්තනයක් නො වේ.'පාලි ක්‍රමය හැර අර්ථ පමණක් ගෙන අප විසින් කළා වූ මේ ප්‍රබන්ධයෙහි...' යනුවෙන් කරන සඳහනෙන් ඒ බව මනාව පැහැදිලි වේ. තවද, මිලින්ද පඤ්හ හා සුත්ත නිපාතය, අට්ඨකථා ආදිය මූලාශ්‍ර කොට ගෙන ඇත.

ප්‍රමාණය - කතා වස්තු තුන්සිය හැට එකකින් පමණ සමන්විත වේ.

භාෂාව - සද්ධර්ම රත්නාවලිය ද අසා රස විඳින්නන් ඉලක්ක කොට ගත් ධර්මදේශනා ශෛලියෙන් (බණ කතා රීතිය) ලියැවුණු කෘතියකි.ධර්ම දේශකයකු වූ ධර්මසේන හිමි තමාගේ දායකයනට බණ කථා වශයෙන් කීවේ ගැමියන් පිළිබඳ කථා ය. මේ සඳහා උන්වහන්සේ ගැමි බස හා ගැමි ව්‍යවහාරය සංකලනයෙන් නිර්මිත මිශ්‍ර සිංහල භාෂාවක් භාවිත කළහ.

'ධර්මසේන හිමියන් තරම් කතා කීමෙහි ශූරයෙක් සිංහල කතාකාරයන් අතර නොවිය'යි මාර්ටින් වික්‍රමසිංහ ශූරීහු සඳහන් කරති.

කතාවක් රසවත් ව ඉදිරිපත් කිරීම සඳහා කර්තෘ හිමියන් භාවිත කළ රචනෝපක්‍රම පිළිබඳ ව විමසන කල්හි උපමා, රූපක, පිරුළු වැනි භාෂා ප්‍රයෝග මගින් ද, අවශ්‍ය තැන්හී දී දිගු වැකි ද තවත් විටෙක කෙටි වැකි ද භාවිත කරමින් අපූර්ව භාෂා ශක්තියක් ප්‍රකට කරන ධර්මසේන හිමියෝ, එමගින් කතා පුවත්වලට නව ප්‍රාණයක් එක් කර ගනිති.

ධර්මසේන හිමියෝ කතාවෙහි ජීව ගුණය පවත්වා ගැනීම සඳහා ඇතැම් කතාවල සංවාදාත්මක අවස්ථා ඉදිරිපත් කොට ඇත.එමෙන් ම චරිත නිරූපණයේ දී හාස්‍ය රසය, උපහාස රසය හා සානුකම්පිත දෘෂ්ටියකින් ද කතා ඉදිරිපත් කිරීම සද්ධර්මරත්නාවලියෙහි භාෂා භාවිතය සුවිශේෂ වීමට හේතු වේ.

RmsnMaths - rmsnmath.blogspot.com

සද්ධර්මරත්නාවලියෙහි තවත් සුවිශේෂ ලක්ෂණයක් නම්, ජාතක කතා පුවත් හා සම්බන්ධ යම් යම් සංසිද්ධි ද උපමා වශයෙන් තම කතා පුවත්වලට ඈඳා ගැනීම හා සෑම කතා වස්තුවක ම ආරම්භයේ දී එම කතාව දැක්වීමට හේතුව ද, කතාව අවසානයේ දී දහම් පණිවුඩයක් ලබා දීමත් සමහර කතාවල නිධාන කතාව ද ඉදිරිපත් කිරීම ය.

- **සාහිත්‍ය කෙටි ප්‍රශ්න**

1. 'උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව' නම් පාඩම උපුටා ගත් මුල් කෘතිය නම් කරන්න.
   සද්ධර්මරත්නාවලිය

2. එහි කතුවරයා කවරෙක් ද? ධර්මසේන හිමි

3. සද්ධර්මරත්නාවලියට පාදක වූ මූලාශ්‍ර ග්‍රන්ථය කුමක් ද? ධම්මපදට්ඨ කථාව

4. සද්ධර්මරත්නාවලිය යන නාමයෙහි අර්ථය පැහැදිලි කරන්න.
   යහපත් ධර්ම නමැති මිණිකැට අමුණන ලද මාලය

5. මේ සඳහා මූලාශ්‍ර සපයා ගත් ත්‍රිපිටකාගත වෙනත් කෘතීන් මොනවා ද?
   සුත්ත නිපාත අටුවාව, බුද්ධවංස අටුවාව, බුද්ධවංස පාළිය

6. එය පාදක කර ගත් බව ග්‍රන්ථයේ සඳහන් වන්නේ කෙසේ ද?
   පාලි ක්‍රමය හැර අර්ථ පමණක් ගෙන අප විසින් කළා වූ ප්‍රබන්ධයෙහි

7. මුල් කෘතියෙහි නොමැති එහෙත් සද්ධර්මරත්නාවලියෙහි ඇතුළත් වන කතා මොනවා ද?
   නාගසේන කථා වස්තුව, සාතාගිර හේමවත කථාව, සූචිසි විවරණ කථාව

8. සද්ධර්මරත්නාවලිය රචනා කිරීමේ අරමුණ සඳහන් කරන්න.
   එසේ හෙයින් නුවණ මඳවත් කුසලච්ඡන්දය ඇති ව ධර්මාභියෝගයට උපදෙස් ලදින්, බණ දැන, පින්කම් හැසිර, නිවන් සාධා ගනිත් නම් එසේ වූ සත්පුරුෂයනට වැඩ සඳහා සද්ධර්මරත්නාවලිය නම් ප්‍රබන්ධයක් කරම්හ.

9. දඹදෙණි යුගයේ රචනා වූ වෙනත් කෘතීන් කිහිපයක් සඳහන් කරන්න.
   පූජාවලිය, සිදත් සඟරාව, කව් සිළුමිණ, අනාගත වංසය, බෝධි වංසය, යෝගාර්ණවය

10. සද්ධර්මරත්නාවලියෙහි භාෂා ශෛලියෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ මොනවා ද?
    - පාලි මූලාශ්‍රයෙන් අර්ථ පමණක් ගැනීම
    - දඹදිව කථා සිංහල ඌරුවට කීම
    - චරිත නිරූපණයේ දී මනුෂ්‍ය සන්තානය තුළ පවතින යහගුණ හා දුර්ගුණ ඉස්මතු කොට මානව දයාවෙන් හා සානුකම්පිත දෘෂ්ටිකෝණයකින් එම චරිත දෙස බැලීම.
    - උචිත අවස්ථාවල දී ජාතක කථාව ද වෙනත් අතීත කථාව ද නිදසුන් ලෙස දැක්වීම.

11. සද්ධර්මරත්නාවලී කතුවරයා කතාවස්තූන් ඉදිරිපත් කිරීමේ දී අනුගමනය කළ පිළිවෙල කුමක් ද?
    - කථාවස්තුව දැක්වීමේ දී එහි අරමුණ පළමුව දැක්වේ.
    - කථාව අවසානයේ දී දහම් පණිවුඩයක් ද ලබාදීම.

RmsnMaths - rmsnmath.blogspot.com

**12.** සද්ධර්මරත්නාවලිය පාඨකයා කෙරෙහි සිත් ඇද ගැනීමට හේතු වූ කරුණු මොනවා ද?

- ධර්මදේශනා ශෛලිය අනුගමනය කිරීම.
- කථා පුවත් ආරම්භයේ දී ගැබ් වූ උපදේශය කීම.
- කථා පුවත් අවසානයේ දී ධර්මෝපදේශය හා එහි ප්‍රයෝජන හෙළි කිරීම.
- පව්කම්හි ආදීනව හා පින්කම්හි ආනිසංස හෙළි කිරීම.
- දහම් දැනුම තීව්‍ර වන ගැඹුරු දහම් කරුණු ලිහිල් ව ගෙනහැර පෑම.
- සෑම කරුණක් ම ශ්‍රව්‍යගෝචර මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීම.
- ශ්‍රද්ධාව වර්ධනය වන සේ කථා ඉදිරිපත් කිරීම.

**13.** 'උග්ගසේන සිටුපුත්හුගේ වස්තුව' ඉදිරිපත් කිරීමේ අරමුණ සඳහන් කරන්න.

වැරදි ශිල්පයෙන් මේ ලෝකයාට ප්‍රයෝජන තිබුණ ද පරලොවට ප්‍රයෝජනයක් නැති බවත්, නිවැරදි ශිල්පයෙන් මෙලොව ද පරලොව ද යහපත සැලසෙන බව ප්‍රකාශ කිරීම.

චන්ද්‍රවංශ හාමුදුරුවෝ

# 'මග විසිතුරු' සැළලිහිණි සන්දේශය - තොටගමුවේ සිරි රාහුල මාහිමි

## කෝට්ටේ අවධිය

- **පසුබිම හඳුනා ගනිමු.**

කෝට්ටේ අවධිය සිංහල පද්‍ය සාහිත්‍යයේ සොඳුරුතම යුගය හැටියට බොහෝ විද්වත්හු සළකති. ඒ සඳහා ප්‍රමුඛතම හේතුව වූයේ ග්‍රන්ථකරණයෙහි නියැළීමෙහිලා රට තුළ පැවති සාමකාමී වාතාවරණය, සවැනි පැරකුම් නිරිඳුගෙන් ලැබුණු රාජ්‍ය අනුග්‍රහය, ගිහි පැවිදි උගත් පඬිවරු පත්කිරීම, ශාස්ත්‍රීය ආයතන රාශියක් බිහිවීම ආදිය යි. කෝට්ටේ අවධිය වන විට පිරිවෙන් අධ්‍යාපනය ද ඉතා දියුණු තත්ත්වයක පැවතිණි.

මේ යුගයේ තොටගමුවේ විජයබා පිරිවෙන්පති ව වැඩ සිටි ෂඩ් භාෂා පරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියෝ සාහිත්‍යකරණයෙහි නියැළුණු විදවත් පඬිරුවනක් වූහ.පරෙවි සංදේශය, සැළලිහිණි සංදේශය, කාව්‍යශේඛරය, යන පද්‍ය කෘති ද පංචිකා ප්‍රදීපය හා බුද්ධිප්පසාදිනී ටීකාව යන ගද්‍ය කෘතීන් ද රාහුල ස්වාමිපාදයන්ගේ විශිෂ්ට නිර්මාණ අතරට ගැනේ. සැළලිහිණි සංදේශය තුළ එහි කාරකයා පිළිබඳ ව සඳහන් නොවූවත්, ඊට ආසන්න අවධියක රචිත සැළලිහිණි සංදේශ පුරාණ සන්නයෙහි එන සඳහනකට අනුව කර්තෘ රාහුල හිමියන් බවට ඉඟි සපයයි.

> 'කඳවුරු කුල මැඳුරු මිණි පහනෙව් සුසැදි
> නැණගුරු සබස සමය ද දැනුමෙන් වොරැදි
> රජගුරු විජයබා පිරුවෙන් හිමි පැහැදි
> මෙමියුරු පදැති සැළලිහිණිය අස්න යෙදී'

සිංහල සංදේශාවලියෙහි පද්‍ය 108 කින් පබැඳි කුඩාතම හා කෙටිම ගමන් ඇති සංදේශ කාව්‍ය සැළලිහිණි සංදේශය යි.සම්මභාව්‍ය ගණයෙහිලා සළකන සංදේශ කෘති දෙකක් රචනා කිරීමේ ගෞරවය ද හිමිවන්නේ තොටගමුවේ සිරි රහල් හිමියන්ටම ය.

- **අරමුණ**

සැළලිහිණි සංදේශය රචනා කිරීමේ අරමුණ වී ඇත්තේ සවැනි පරකුම් නිරිඳුගේ කනිටු දියණිය වන ලෝකනාථා හෙවත් උලකුඩය දේවියට පුත් කුමරෙකු ලබා දෙන ලෙස ඉල්ලමින් ජයවර්ධනපුරයේ සිට කැළණියේ විභීෂණ දෙවින්ට ආයාචනයක් කිරීමයි.එමගින් පරකුම්බා රජුගෙන් පසුව රාජ්‍යත්වයට සුදුසු පුත් කුමරෙකු ලබා ගැනීමයි.

නන්නූර්තුනයා අමාත්‍යවරයාට දාව උලකුඩය දේවියට පුත් කුමරෙකු උපන් අතර ඔහුගේ නාමය ජයබාහු නම් විය.සවැනි පැරකුම් නිරිඳුගේ ඇවෑමෙන් ජයබාහු කුමරු රජ විය.මේ වන විට යාපා පටුන පාලනය කරමින් සිටි සපුමල් කුමරු ජයබාහු කුමරු ඝාතනය කොට රාජ්‍ය පැහැර ගත්තේ ය.මේ සඳහා අපක්ෂපාතී ව කටයුතු කළ ජයබාහුගේ සෙනෙවිවරුන් විසින් සපුමල් කුමරුට විරෝධය පා සේනාව සංවිධානය කොට කරලි ගසන ලදි.සපුමල් කුමරුට පක්ෂපාතී වූ වීදාගම මාහිමියන්ගේ පාක්ෂිකයන් හා තොටගමුවේ සිරි රහල් හිමියන්ගේ පාක්ෂිකයන් අතර විශාල අරගලයක් විය.සිංහල සංදේශ යනුවෙන් මෙම අරගලය ඉතිහාස ගත වී ඇත.

RmsnMaths - rmsnmath.blogspot.com

- තොටගමුවේ සිරි රාහුල මාහිමියෝ

මෞර්ය වංශික කඳවරුරු කුලයට අයත් වික්‍රමබාහු නම් ප්‍රදේශාධිපතියාගේ පුත්‍රයෙකි. සයවන පැරකුම් නිරිඳුගේ පුත් තනතුරේ වැඩුණු බවත්, වීදාගම හිමි නම් තෙර නමකගේ ශිෂ්‍යයෙකු වශයෙන් පැවිද්ද ලත් බවත්, සිංහල, පාලි, සංස්කෘත, පෛශාචි, ශෞරසේනි, අපභ්‍රංස, ප්‍රාකෘත යන භාෂාවන් ද සංස්කෘත කවි සමය හා ව්‍යාකරණ ද, බණ දහම් ද, උගත් බවත් එනිසා ෂඩ් භාෂා පරමේශ්වර යන විරුදාවලිය ලත් බවත් සඳහන් වෙයි.එසේ ම ජ්‍යෝතිර්වේදය පිළිබඳ හසළ දැනුමක් ලත් බව ද කියැවේ. සිංහලයේ දෙවන මහා කාව්‍ය වූ කාව්‍යශේඛරය ලිවීම නිසා සිවුපදයෙන් මහා කාව්‍යයක් ලිවීමේ පුරෝගාමියා වන්නේ ද උන්වහන්සේම ය. සරස්වතී තෛලය නම් මහා බලගතු තෛලයක් වැළඳීම නිසා, අසාමාන්‍ය ස්මරණ ශක්තියක් ද උන්වහන්සේට පහළ වූ බව ජනප්‍රවාදවල එයි. (ක්‍රි.ව. 1471) දී ඉඳුරුව ප්‍රදේශයේ ගල් ලෙනක දී අපවත් වූ උන්වහන්සේගේ දේහය පෘතුග්‍රීසීන් විසින් ඉන්දියාවට රැගෙන ගිය බවත්, එහි දෙව්මැඳුරක තැන්පත් කොට ඇති බවත් සඳහන් වේ. සරස්වතී තෛලය වැළඳීමත්, මරණාසන්නයේ දී සිද්ධාලෝක නම් තෛලයක් වැළඳූ නිසාත් මෘත ශරීරය තවමත් විනාශ නොවී පවතින බව ජනප්‍රවාදවල සඳහන් වෙයි. දකුණු පළාතේ තෙල්වත්ත රන්පත් විහාරයේ විස්තරයෙහි උන්වහන්සේ ගැන බොහෝ තොරතුරු හා ජනප්‍රවාද ඇතුළත් වේ.

- **සැළලිහිණි සංදේශය සාහිත්‍ය කෙටි ප්‍රශ්න**

**1.** කෝට්ටේ යුගයේ සාහිත්‍යකරණයේ නියැළුණු භික්ෂූන් වහන්සේලා දෙනමක් නම් කරන්න.
වීදාගම මෛත්‍රේය හිමි
වෑත්තෑවේ හිමි

**2.** කෝට්ටේ යුගයේ පැවති විද්‍යාස්ථාන තුනක් නම් කරන්න.
කැරගල පද්මාවතී පිරිවෙන
තොටගමුවේ විජයබා පිරිවෙන
සුනේත්‍රාදේවී මහ පිරිවෙන

**3.** තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමි ලද ගෞරව නාමය කුමක් ද? ෂඩ් භාෂා පරමේශ්වර

**4.** සැළලිහිණි සංදේශයේ කතුවරයා ශ්‍රී රාහුල මාහිමි බව සඳහන් වන ග්‍රන්ථය කුමක් ද?
සැළලිහිණියා අස්න

**5.** තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන් විසින් ලියන ලද වෙනත් කෘති කිහිපයක නම් ලියන්න.
පරෙවි සන්දේශය
කාව්‍යශේඛරය
සැළලිහිණි සන්දේශය
පංචිකා ප්‍රදීපය
බුද්ධිප්පසාදිනිය

**6.** සැළලිහිණි සංදේශය රචනා කිරීමේ අරමුණ සඳහන් කරන්න.
සවැනි පැරකුම් නිරිඳුගේ කනිටු දියණිය වන ලෝකනාථා හෙවත් උලකුඩය දේවියට පුත් කුමරෙකු ලබා දෙන ලෙස ඉල්ලමින් ජයවර්ධනපුරයේ සිට කැළණියේ විභීෂණ දෙවින්ට ආයාචනයක් කිරීමයි. එමගින් පරකුම්බා රජුගෙන් පසුව රාජ්‍යත්වයට සුදුසු පුත් කුමරෙකු ලබා ගැනීමයි.

RmsnMaths - rmsnmath.blogspot.com

**7.** සැළලිහිණියාගේ ගමන් මගේ ආරම්භක හා අවසාන ස්ථාන දෙක දක්වන්න.
කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුරයේ සිට
කැලණිය විහාරයේ පිහිටි විභීෂණ දේවාලය දක්වා

**8.** සෙසු සංදේශ කාව්‍ය හා සැසඳීමේ දී සැළලිහිණි සංදෙයේ සුවිශේෂ ලක්ෂණ කවරේ ද?
ස්වභාව සෞන්දර්ය වර්ණනා රැසක් ඇතුළත් වීම.
ප්‍රතිභාපූර්ණ කවිත්වය පිළිබිඹු වීම.
කෙටිම සන්දේශ කාව්‍ය වීම.
කෙටිම ගමන් මාර්ගය යෙදීම.

**9.** සැළලිහිණි සංදේශයේ භාවිත ප්‍රධාන විරිත නම් කරන්න. සමුද්‍රඝෝෂ විරිත - පාදයක මාත්‍රා 18 කි.

**10.** සැළලිහිණි සංදේශයෙහි භාරකයා හා හා ප්‍රතිග්‍රාහකයා නම් කරන්න.
භාරකයා - සැළලිහිණියා
ප්‍රතිග්‍රාහකයා - කැලණියේ විභීෂණ දෙවියන් වෙත

**11.** සැළලිහිණි සංදේශයෙහි පද්‍ය ගණන කොපමණ ද? පද්‍ය 108කි.

චන්ද්‍රවංශ හාමුදුරුවෝ

## කෑරගලය වැජඹෙයි මේ ලෙසින් සිට. 'හංස සන්දේශය'
## විදාගම මෛත්‍රෙය හිමි කෝට්ටේ යුගය

- **කෙටි ප්‍රශ්න මගින් හංස සංදේශය හඳුනා ගනිමු.**

**1.** කෑරගලය වැජඹෙයි කවිපෙළ උපුටාගෙන ඇත්තේ කිනම් ග්‍රන්ථයෙන් ද? හංස සන්දේශය

**2.** හංස සංදේශයෙහි කතුවරයා කවරෙක් ද? විදාගම මෛත්‍රෙය හිමි

**3.** හංස සංදේශය රචනා වූ යුගය හා එවකට රාජ්‍යය පාලනය කරන ලද්දේ කවුරුන් විසින් ද?
කෝට්ටේ යුගය - සවන පැරකුම් රජ දවස

**4.** හංස සංදේශය රචනා කිරීමේ අරමුණ කුමක් ද?
කෑරගල වනරතන මාහිමියන් ලවා සමන්, විභීෂණ, උපුල්වන්, කතරම යන දෙවිවරුන් සතුටු කොට, පිරිත් අසන්නට සලස්වා පින් දී, එමගින් සිරි පැරකුම් නිරිඳුට සෙත සැලැසීම.

**5.** හංස සංදේශයෙහි භාරකයා කවුද? හංසයා

**6.** දූතයාගේ ගමන් මග කෙසේ වී ද?
ජයවර්ධනපුරයේ සිට දියවන්නා ඔයේ කොත්තගංතොට, ගුරු බැවුල, වෙළෙඳගොඩ, කිත්සිරිමෙවන් විහාරය, මක්කෙලිය, කැලණිය, වැබඩ, වැලිවේරිය, හේනේගම, මාදෙල්ගස්ගම, නාකඳපොළ පසු කොට කෑරගල පද්මාවතී පිරිවෙන

**7.** සංදේශයෙහි ගමන් කාලය කෙබඳු වී ද?
ගමනාරම්භය - පෙර දා උදෑසන
රාත්‍රිය ගත කිරීම - කැලණිය වෙහෙර
පසු දා උදෑසන ගමනාරම්භය - කැලණියේ සිට
ගමනාන්තය - එදින සවස කෑරගල පද්මාවතිය පිරිවෙනට

**8.** හංස සංදේශයට සමකාලීන වෙනත් සංදේශ මොනවා ද?
පරෙවි සංදේශය
කෝකිල සංදේශය
සැළලිහිණි සංදේශය
ගිරා සංදේශය
හංස සංදේශය

**9.** හංස සංදේශයෙහි සුවිශේෂ ලක්ෂණ මොනවා ද?
ථේරවාද බෞද්ධ දර්ශනය ඉස්මතු කිරීම.
යති නායකයකු පාදකකොට ගැනීම.
ස්වභාවෝක්ති වර්ණනා.
ආධ්‍යාත්මික ගුණ ඉස්මතු වීම.

**10.** හංස සංදේශයට කොපමණ පද්‍ය සංඛ්‍යාවක් ඇතුළත් වී ද? කවි 206කි.

නන්දවංශ සමුදුරුවෝ

11. විද්‍යාගම හිමියන් රචනා කළ වෙනත් කෘති කිහිපයක් දක්වන්න.
බුදුගුණ අලංකාරය
ලෝවැඩ සගරාව
දහම්ගැට මාලාව
කව්ලකුණු මිණි මඬල

12. පාලි රසවාහිනී කෘතියෙහි කැරගල හැඳින්වූයේ කුමන නමකින් ද? වත්ථුල පබ්බත

13. මෙම කෘතිය රචනා වන අවධිය වන විට දියුණු ව පැවති විද්‍යාස්ථාන කවරේ ද?
කැරගල පද්මාවතී පිරිවෙන
තොටගමුවේ විජයබා පිරිවෙන
රයිගම ඝනානන්ද පිරිවෙන
දඹදෙණියේ මයූරපාද පිරිවෙන

14. සිංහල සංදේශාවලියෙහි දීර්ඝතම සහ කෙටිම සංදේශ කෘති කවරේ ද ?
- කෙටි සන්දේශය - කවි 108කි. 'සැළලිහිණි සන්දේශය' ජයවර්ධනපුරයේ සිට කැලණියේ විභීෂණ දේවාලය දක්වා

- දීර්ඝතම සන්දේශය - කවි 291කි. 'කෝකිල සන්දේශය' දෙවිනුවර සිට යාපා පටුන දක්වා

චන්ද්‍රවංශ හාමුදුරුවෝ

## 'දෑතේ කරගැට සිඹ සනසන්නට' මහගමසේකර - ක්‍රි.ව. 1929-1976



- ගායනය - පණ්ඩිත් ඩබ්.ඩී.අමරදේව සහ විමලා අමරදේව
- පද රචනය - මහගමසේකර
- ගී තනුව - පණ්ඩිත් ඩබ්.ඩී. අමරදේව

මෙම නිර්මාණය 'ප්‍රබුද්ධ' කාව්‍ය සංග්‍රහයේ මෙන් ම, සේකරයන්ගේ ම 'නොපළ ගීත' කෘතියෙහි 'ප්‍රාර්ථනා' නමින් ද පළ වී ඇත.

- **මහගමසේකර ජීවන තොරතුරු හා සාහිත්‍ය නිර්මාණ**

1. මහගමසේකරයන්ගේ උපත සිදු වූයේ කොහේ දී ද? කවරදා ද? **1929 කිරිඳිවැල රදාවාන නම් ගමෙහි**

2. එතුමා අධ්‍යාපනය ලැබූ පාසල නම් කරන්න. **රාජකීය හේවාවිතාරණ බෞද්ධ පාසල**

3. එතුමාට ආචාර්ය උපාධිය පිරිනැමූ විශ්වවිද්‍යාලය කුමක් ද? **නිට්ටඹුව ගුරු අභ්‍යාස විද්‍යාලය**

4. එතුමා විසින් රචිත ශාස්ත්‍රීය පර්යේෂණ කෘතිය නම් කරන්න **ගද්‍ය පද්‍ය නිර්මාණයන්හි රිද්ම ලක්ෂණ**

5. මහගමසේකර නියැළුණු වෘත්තීන් තුනක් නම් කරන්න. **පුහුණු ගුරුවරයෙකු, පුවත්පත් කලාවේදියකු, කථිකාචාර්යවරයෙකු**

6. ඔහුගේ මුල් ම කාව්‍ය කෘතියේ නම ලියන්න. **වහංගා 1960**

7. මහගමසේකර අයත් සාහිත්‍ය යුගය නම් කරන්න. **නූතන කවි පරපුර**

8. මහගමසේකරගේ පරිවර්තන ග්‍රන්ථය කුමක් ද? **ධවල සේනාංකය 1956**

9. මහගමසේකර සිනමා නිර්මාණය සඳහා පාදක කොටගත් නව කතාව කුමක් ද? එම සිනමා නිර්මාණය නම් කරන්න. **තුංමං හදිය - තුංමං හන්දිය**

10. මහගමසේකරගේ එක ම සිනමා නිර්මාණය හා ප්‍රථම සිනමා නිර්මාණය ජාත්‍යන්තර සිනමා උළෙල ත්‍රිත්වයක් නියෝජනය කළේ ය. එම ආයතන තුන නම් කරන්න.
**ටෂ්කන්ට්**
**කොලෝව්වාරි**
**අන්තර්ජාතික කතෝලික සිනමා සංවිධානය**

11. හැත්තෑව දශකයේ විශිෂ්ටතම සිනමා නිමැවුමට හිමි සම්මානය ප්‍රදානය කළ ජාත්‍යන්තර ආයතනය නම් කරන්න. **අන්තර්ජාතික කතෝලික සිනමා සංවිධානය**

12. 1971 දී හොඳම කාව්‍ය සංග්‍රහයට හිමි රාජ්‍ය සම්මානය හිමි වූයේ කුමන කාව්‍ය සංග්‍රහයට ද? **බෝඩිම**

RmsnMaths - rmsnmath.blogspot.com

**13.** සංස්කෘත දෙපාර්තමේතුව මගින් 'දහසින් බැඳි පියලි' ත්‍යාගය හිමි වූයේ කුමන කලා කෘතිය සඳහා ද? **වෝර පබබත**

**14.** එතුමා අභාවප්‍රාප්ත වූ දිනය සඳහන් කරන්න **1976 ජනවාරි මස 14 දින**

**නාට්‍ය ග්‍රන්ථ**

නොමියෙමි - 1917
ප්‍රබුද්ධ - 1977
හෙට ඉරක් පායයි - 1963
බෝඩිම - 1970

සක්වා ළිහිණි - 1962
ව්‍යංගා (කේ.ජයතිලක සමග) - 1960
මක් නිසාද යත් - 1964
රාජතිලක ලයනල් සහ ප්‍රියන්ත - 1967

**නවකතා**

කුං මං හන්දිය - 1967
මනෝ මන්දිර - 1971

**නාට්‍ය ගීත**

සන්නාලියනේ සන්නාලියනේ
ඈත කඳුකර හිමව් අරණේ

**ළමා සාහිත්‍යය**

පුංචි අයට කයි කතන්දර(ළමා නාට්‍ය - 1985)
කොටි වල්ගය(ළමා නාට්‍ය) - 1990
සරු පොළොවක් අපට ඇතේ - 1973
ගී සීපද

**කෙටි කතා**

මහගමසේකරයන්ගේ කෙටිකතා හා චිත්‍ර - 1981

**ගේය පද රචනා**

රත්න දීප ජන්ම භූමි
ඈසේ මතුවන කඳුළු බිඳු ගෙන
පාළු අඳුරු නිල් අහස මමයි
පිලේ පැදුර
අන්න බලන් සඳ
වනන්තරේ වන සපුමල් පිපියන්
ඔබේ නමින් සැය බඳිමි

**නාට්‍ය**

කුණ්ඩල කේශී
සද්දන්ත - 1961
හංස ගීතය 1961
මුදු පුත්තු (ගුණසේන ගලප්පත්ති සමග) - 1965

RmsnMaths - rmsnmath.blogspot.com

# 'වස්සානය' රත්න ශ්‍රී විජේසිංහ



රත්න ශ්‍රී විජේසිංහයන්ගේ වස්සානේ කාව්‍ය කෘතියෙහි එන වස්සානේ පද්‍ය පන්තිය නිර්මාණය වූයේ ඔහු ගුරුවරයෙකු ලෙස මොනරාගල දිස්ත්‍රික්කයේ හුලංදාඔය සමීපයේ ජීවත් වූ කාලයේ ය.එම පරිසරය ද ජන ජීවිතය ද මැනවින් අත්විඳි කවියා එමගින් නිර්මාණ රැසක් ජාතියට දායාද කළේ ය.වස්සානය පද්‍ය නිර්මාණය ජීවන දර්ශනය කැටිකර ගත් අපූර්ව පරිසර චිත්‍රණයක් ද වෙයි.

**වස්සානේ කවි පෙළ උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද?** 1985 පළ වූ වස්සානේ නම් පද්‍ය පන්තියෙනි. එය ප්‍රථම වරට මුද්‍රණය කොට ඇත්තේ 1985 වසරේ දී ය.

**එහි කවියා කවරෙක් ද?** රත්න ශ්‍රී විජේසිංහ කවියා

**ඔහුගේ භූමිකාවේ දක්නට ලැබෙන විශේෂතා කවරේ ද?**

රත්න ශ්‍රී විජේසිංහ කවියා ගුරුවරයෙකි.කවියෙකි.ගීත රචකයෙකි.ගුරු විද්‍යාල කථිකාචාර්යවරයෙකි (සිංහල). ජ්‍යේෂ්ඨ සහකාර ලේකම්වරයෙකි. පුවත්පත් කලාවේදියෙකි.රූපවාහිනී හා ගුවන්විදුලි වැඩසටහන් සම්පාදකවරයෙකි.

**ජීවන තොරතුරු**

| | | |
|---|---|---|
| උපත | - | 1953 ජූලි 02 |
| ගම් ප්‍රදේශය | - | ගාල්ල නාකියාදෙණිය තෙල්ලඹුර |
| අධ්‍යාපනය | - | නාවල රජයේ කනිටු පාසැල |
| | - | ඉහල තෙල්ලඹුර දුටුගැමුණු පාසැල |
| | - | හික්කඩුව ශ්‍රී සුමංගල මධ්‍ය මහා විද්‍යාලය |
| | - | ගාල්ලේ රිච්මන්ඩ් විද්‍යාලය |

**රැකියා ස්ථාන**

ගාල්ල නැංමුංගල විදුහල (උපගුරු)
මොනරාගල හුලංදාව විදුහල (උපගුරු)
ගාල්ල ඇලෝසියස් විදුහල (උපගුරු)
දකුණු පළාත් අධ්‍යාපන කාර්යාලයේ සිංහල භාෂා ඒකක භාර නිලධාරී
උණවටුන ගුරු විදුහලේ සිංහල විෂය කථිකාචාර්ය
සමෘද්ධි අමාත්‍යාංශයේ සහකාර ලේකම්

**අධ්‍යාපන සුදුසුකම්**

සිංහල විෂය පිළිබඳ ගෞරව උපාධිය (පේරාදෙණිය සරසවිය)
ශාස්ත්‍රපති උපාධිය (කැලණිය සරසවිය)

**රත්න ශ්‍රී කවියා සම්මාන ලද ගීත සංග්‍රහ මොනවා ද?**

| | |
|---|---|
| වංකගිරි අරණේ | 1990 |
| සුදු නෙළුම | 1993 |
| නෙත නිලුපුල් | 2002 |
| ආලකමන්දා | 2008 |

නන්දවංශ හාමුදුරුවෝ
ඉසුරු පන්තිය නන්දවංශ
RmsnMaths - rmsnmath.blogspot.com

**වෙනත් කාව්‍ය ග්‍රන්ථ**

බිය නොවන්න අයියණ්ඩිය 1979
සුබ උදෑසනක් 1988 (රාජ්‍ය සම්මාන)
සල් ගහ යට 1996
තරු ලකුණ 1997 (ගොඩගේ සම්මාන)
මධ්‍යම යාමය 2004 (ගොඩගේ සම්මාන)
සන්ධ්‍යා තීර්ථය 2010

**ළමා ගීත**

සැළලිහිණියෝ 1990 (රාජ්‍ය සම්මාන)
රන්කිරිකැට 1993 (රාජ්‍ය සම්මාන)
රතු කිකිළි 1995
සිංදු කියන උණ පඳුර (රාජ්‍ය සම්මාන)
ළහිරු මඬල සූරිය උදාවනතුරු
ගල් අරඹේ ඇතින්නියා
පැණි කුරුල්ලෝ

**ජනප්‍රිය ගීත රචනා**

සුදු නෙළුම කෝ සොරබොර වැවේ
කිරුළ මුතු ලිහී සර සර හඬින් වැගිරෙනා
අජානේය ස්තුටර තුරඟා පිට වඩිනා
ගංගාවක් වී ගලන්න
දෝත නලලත තබා හිටගෙන
මගේ දුවේ ඔබ අවදියෙන් නම්
පුන් සඳ යට ඇවිදින්
බිම්බරක් සෙනග ගැවසුණ
ලෙන්විනා මගේ නංගියේ

**ගීත රචනා ග්‍රන්ථ**

වංක ගිරිය අරණේ 1990 (රාජ්‍ය සම්මාන)
සුදු නෙළුම 1993 (රාජ්‍ය සම්මාන)
ගංගා ගීතය 1995
ඉරබටු තරුව 1998
නෙත නිලුපුල් 2002 (රාජ්‍ය සම්මාන)
ආලක මන්දා 2008 (රාජ්‍ය සම්මාන)

**ශාස්ත්‍රීය ලිපි**

ලිය වැල අත්පසුර
කටු ගහ සංවාද
මහගමසේකර හා සමාජ යථාර්ථය
(මහාචාර්ය සුචරිත ගම්ලත් සමග)
ලස්සනම අහස හා මතක සිතුවිලි

**ජනප්‍රිය පද්‍ය රචනා**

වංක ගිරියට මාරු වීම
අම්මේ පෙම්බරා
අම්මාගේ සාක්කිය

# 'දියමන්ති මාලය' ගී ද මෝපසාං



- **දියමන්ති මාලය කෙටිකතාව සාහිත්‍ය කෙටි ප්‍රශ්න**

1. විශ්ව සාහිත්‍යයේ කැපී පෙනෙන කෙටිකතාකරුවන් දෙදෙනකුගේ නම් ලියා දක්වන්න.
   ඇන්ටන් චෙකෝෆ්, එඩ්ගා ඇලන් පෝ

2. අපේ රටේ දක්ෂ පරිවර්තන සාහිත්‍යකරුවන් දෙදෙනකු නම් කරන්න.
   සිරිල් සී. පෙරේරා
   කේ.ජී. කරුණාතිලක
   කේ.බී. සුගතදාස

3. දියමන්ති මාලය කෙටිකතාවේ කතුවරයා කවරෙක් ද? ගී ද මෝපසාං

4. මූලික අධ්‍යාපනයෙන් පසුව ඔහු නිරත වූ රැකියා සඳහන් කරන්න. යුද සේවය, ලිපිකරු සේවය

5. මෝපසාං ඇසුරු කළ ප්‍රංශයේ මහා ලේඛකයාගේ නම කුමක් ද? ගුස්ටාව් ෆ්ලොබෙයාර්

6. මෝපසාංගේ මුල් ම කෙටිකතාව  සඳහන් කරන්න ඉටි බෝලය

7. මෝපසාං ලියූ වෙනත් කෙටිකතා දෙකක් නම් කරන්න. නූල් කෑල්ල, හඳ පාන

8. මෝපසාංගේ කෙටිකතා රීතියේ විශේෂ ලක්ෂණයක් සඳහන් කරන්න.
   මුල මැද අග යන ත්‍රිවිධ අවස්ථා දැකගත හැකි වීම

9. දියමන්ති මාලය සිංහල බසට පරිවර්තනය කළ ලේඛකයාගේ නම කුමක් ද? කේ.ජී. කරුණාතිලක

10. ඔහු විසින් පරිවර්තනය කරන ලද වෙනත් කතා දෙකක නම් ලියන්න.
    බිම්ගෙයි සිරකරුවා හා වෙනත් ශ්‍රේෂ්ඨ කෙටිකතා
    අබිරහස් මන්දිරය හා වෙනත් ශ්‍රේෂ්ඨ කෙටිකතා